අල්ලාහ්ගේ දූතයාණන්ගේ -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- සහගාමීහූ, එතුමාගේ කාලයේ, තම හිස් (නිදිමත හේතුවෙන්) පහත්වන තරමට ඉෂා (සලාතය) බලාපොරොත්තුවෙන් සිටින්නන් වූහ. පසුව ඔවුන් සලාතය ඉටු කළහ. නමුත් ඔවුහු වුළූ කරන්නන් ලෙස නොසිටියහ.

අනස් ඉබ්නු මාලික් -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. “අල්ලාහ්ගේ දූතයාණන්ගේ -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- සහගාමීහූ එතුමාගේ කාලයේ, තම හිස්
(නිදිමත හේතුවෙන්) පහත්වන තරමට ඉෂා (සලාතය) බලාපොරොත්තුවෙන් සිටින්නන් වූහ. පසුව ඔවුන් සලාතය ඉටු කළහ. නමුත් ඔවුහු වුළූ කරන්නන් ලෙස නොසිටියහ.“
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් අබූ දාවූද් එය වාර්තා කර ඇත - ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

නබි-සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමාගේ ජීවිතයේ සහාභාවරු ඉෂා සලාතය අවසානය දක්වාම බලපොරොත්තුවෙන් සිටියහ. ඔවුහු ඒ අතරවාරයේ තද නින්දක් නොව මද නින්දකට වැටුණහ. පසුව ඔවුහු නැගිට වුළූ නොගෙනම සලාතය ඉටු කළහ. එතුමාගේ කාලයේ යම් ක්රියාවක් සිදු කොට එතුමා එය නොවැළැක්වූයේ නම්, එය පිළිගනු ලැබූවක් බවට සැලකේ. එසේ පිළිගැනීම නබිතුමාගේ සුන්නාවේ මාර්ග අතුරින් එකකි. එනම් එතුමාගේ ප්රකාශය ක්රියාව හා පිළිගැනීම යන සුන්නාවේ මාර්ග වෙති. ඒ අනුව එතුමාගේ කාලයේ සිදු කරන ලද යමක් එතුමා නොවැළැක්වූයේ නම්, එය පිළිගන්නා ලද සුන්නාවක් ලෙස සැළකේ. හේතුව ඔවුන්ගේ සලාතය නිෂ්ඵල වූවක් නම් හෝ ඔවුන් කළ ක්රියාව සුදුසු නොවේ නම් හෝ එතුමා එ් ගැන ඔවුනට දන්වා සිටින්නට තිබුණි. එය එතුමා දැන සිටි දෙයකි. එසේ නැතිනම් ඒ ගැන එතුමාට වහී මාර්ගයෙන් දන්වා තිබූ දෙයකි. මෙය එතුමාගේ මරණයෙන් පසු සිදුවන කිසිවකට අදාළ නොවන්නේය. එයට ප්රතිවිරුද්ධය. “ඔවුන්ගේ හිස් පහත්ව පැවතිණ.“ එනම්: නිදිමත ඉක්මවා ගිය බැවින් එසේ හිස් ඇළවෙන්නට විය. යන්නයි. තවත් වාර්තාවක ඔවුන් අතර සිටි එක් අයකුගේ ගෙරවිලි හඬට සැබැවින්ම මම සවන් දුනිමි. පසුව නැගිට සිට සලාතය ඉටු කළහ. නමුත් වුළූ දෝවනය නොකළහ.“ එනම් වුළූ අළුතින් නොගෙනම සලාතය සඳහා නැගිට සිටියහ යන්නයි. හේතුව ඔවුන්ගේ නින්ද ගැඹුරු නින්දක් නොවූ බැවිනි. එය වුළූ දෝවනය බිඳ දමන්නක් නම් ඒ සඳහා සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා ඔවුනට අනුමත නොකරන්නට තිබුණි. මේ සාධක පදනම් කර ගෙන ඒවා ගොනු කර පවසන්නේ නම් සැබැවින්ම නින්ද මළපහ මෙන් වුළූ බිඳන කරුණු අතුරිනි. නමුත් නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා “මළ මූත්රා හා නින්ද හැර“ යනුවෙන් පැවසූහ. තවදුරටත් අලී රළියල්ලාහු අන්හු තුමා වාර්තා කළ හදීසයක සඳහන් පරිදි සල්ලල්ලාහු අලය්හි වසල්ලම් මෙසේ පවසා ඇත්තාහ. "ඇස කුහරයේ අාවරණයයි. එහෙයින් කවරෙකු නිදා ගන්නේද ඔහු වුළූ ගනිත්වා!“ මුආවියා -රළියල්ලාහු අන්හු- තුමා වාර්තා කළ හදීසයක. “ඇස කුහරයේ අාවරණයයි. ඇස්දෙක නිදාගත් විට අාවරණය විවෘතවනු ඇත.“ මෙම සාධකවලින් නිරූපණය වනුයේ සැබැවින්ම නින්ද වුළු අවලංගු කරන බවය. මෙම පාඩමට අයත් හදීසයේ හා ඒ සමඟ වෙනත් වාර්තා දන්වා සිටිනුයේ සැබැවින්ම සුළු නින්ද වුළු අවලංගු නොකරන බවය. ඒ අනුව මෙම පාඩමට අදාළ හදීසය හා “ගෙරවිල්ල හා පැත්තට ඇළවීම“ යන වාර්තාව අවධාරණය කරනුයේ සැබැවින්ම නින්ද ගැඹුරු නින්දන් නොවිය යුතු බවය. සැබැවින්ම ඔවුන් අතර කෙනෙකුගේ ගෙරවිලි හඬ ඇසෙන්නට හේතු වූයේ ඔහු ගැඹුරු නින්දනට වැටෙන්නට පෙර ඔහු නිදන්නට

[illegible]

http://www.sunnah.global/hadeeth/si/show/8394